# තරුවෙන් ගණිතය...
# දිල්ශාන් බී ප්‍රියදර්ශන
## grade 6
## Final Medal Maths Exam - May

- අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.

1) වෘත්තාකාර හැඩයක් දැක්ය නොහැකි වස්තුවක් වන්නේ,

1) රබාන 2) රු 5 කාසිය 3) තේ හැන්ද 4) ටයරය

---

2) 4 728 352 යන සංඛ්‍යාවේ 7 ඉලක්කමේ ස්ථානීය අගය වන්නේ,

1) 100 2) 1000

3) 10000 4) 100000

---

3) 524 237 359 යන සංඛ්‍යාවේ 3 ඉලක්කම් වලින් නිරූපණය වන අගයයන් අඩුකළ විට පිළිතුර වන්නේ,

1) 20300 2) 39300

3) 29700 4) 39500

---

4) 'දෙමිලියන පහ' යන සංඛ්‍යාව නිවැරදිව දැක්වෙන්නේ,

1) 200 000 005 2) 2 000 005

3) 2 005 4) 2 000 500

---

5) පාසලක පිරිමි ළමයි 520 ක්ද, ගැහැණු ළමයි 672 ක් ද සිටියි. ඉන් ළමුන් 45 ක් පාසලට පැමින නැත්නම් පාසලේ එදින සිටින මුළු ළමුන් ගණන සොයන්න.

1) 1147 2) 1237 3) 1456 4) 1465

LIVEWORKSHEETS

6) වෘත්තයකට ඊතල විදින තරගයකදී ලකුණු ලබා දී ඇත්තේ පහත ආකාරයටය.

- වෘත්තය මතට විදීමේදී - ලකුණු 20 යි.
- වෘත්තය තුළට විදීමේදී - ලකුණු 10 යි.
- වෘත්තයෙන් පිටතට විදීමේදී ලකුණු හිමි වන්නේ නැත.

මෙම තරගයට සහභාගිවන සිසුවෙකුට වාර 3 ක් ඊතලය විදීමට අවස්ථාව දෙන්නේ නම් ඔහුට රැස්කරග ශැකි මුළු ලකුණු ප්‍රමාණය කීයද?

1)10  2)20  3)40  4)60

---

7) 82345761300 යන සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා ඇති නිවැරදි පිළිතුර වන්නේ,

1) 823,457,613,00  2) 823 457 613 00

3) 82,345,761,300  4) 82 345 761 300

---

8) $48 \div 5$ හි ලබ්ධිය හා ශේෂය වනුයේ පිළිවෙළින්,

1) 9,3  2) 9,0  3) 8,8  4) 8,3

---

9) $270000 \div \square = 270$ හිස්තැනට නිවැරදි පිළිතුර වන්නේ,

1) 10  2) 100  3) 1000  4) 10000

---

10) 87654 හි 7 න් නිරූපිත අගය වන්නේ,

1) 1000  2) 7

3) 7000  4) 7654

---

11) 57 008 020 000 යන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය වන්නේ,

1) පනස් හත් අට මිලියන විසිදහස

2) පනස් හත් මිලියන අසූ මිලියන විසිදහස

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන
LIVEWORKSHEETS

3) පනස් හත් බිලියන අට මිලියන විස්ස

4) පනස් හත් බිලියන අට මිලියන විසිදහස

---

12) $A, B$ හිස්කොටු වලට නිවැරදි පිළිතුරු වන්නේ,

$$\begin{array}{r} 3\ 7\ \boxed{A}\ 4 \\ -\ 2\ 3\ 9\ 5 \\ \hline 1\ \boxed{B}\ 0\ 9 \\ \hline\hline \end{array}$$

1) $A = 0\ ,\ B = 3$


2) $A = 9\ ,\ B = 4$

3) $A = 9\ , B = 3$

4) $A = 0\ , B = 4$

---

13) ගණක රාමුවෙන් නිරූපණය කර ඇති සංඛ්‍යාවේ 6 ඉලක්කම පිහිටි කලාපය කුමක්ද?




1) ඒකක කලාපය

2) දහස් කලාපය

3) මිලියන කලාපය

4) බිලියන කලාපය

---

14) ලෝක ළමා දිනය වෙනුවෙන් 6 ශ්‍රේණියේ සිසුන්ට එකක් රු 50 ක් වන චොක්ලට් එක බැගින් ළමයෙකුට ලබා දීමට තීරණය කර ඇත. $6 - A$ ශ්‍රේණියේ ළමුන් 40 ක්ද, $6 - B$ ශ්‍රේණියේ ළමුන් 38 ක් ද, $6 - c$ ශ්‍රේණියේ ළමුන් 35 ක් ද, සිටියි. චොකලට් සියලුම සිසුන්ට ලබාදීමට වැය වන මුදල කීයද?

1) රු 1130

2) රු 2260

3) රු 4720

4) රු 5650

LIVEWORKSHEETS

15) 3,4,8,7,5 යන ඉලක්කම් වලින් එක් ඉලක්කමක් එකවරක් බැගින් යොදාගනිමින් ලිවිය හැකි විශාලම ඉරට්ට සංඛ්‍යාව ලියන්න.

1) 87534 2) 85743 3) 84578 4) 87543

---

16) ☐ $\times 1000 = 83000$ හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව වනුයේ,

1)83 2)830 3)8300 4)1000

---

17) 'අට බිලියන අට මිලියන අසූදහස් අටසීය' යන සංඛ්‍යාව සම්මත ආකාරයට ඉලක්කමෙන් දැක්වෙනුයේ,

1) 8 080 080 800 2) 8008080800

3) 8 008 080 800 4) 8 8 80 800

---

18) පහත ගණිත ප්‍රකාශන සලකන්න.

Ⓐ $0 \div 12$ Ⓑ $15 \div 15$ Ⓒ $100 \div 10$

පිළිතුරු ලෙස 0 ලැබෙන්නේ ඉහත ඒවායින් කවර ඒවාගේද?


1) $A$ **පමණි.** 2) $A, B$ **පමණි.**


3) $B$ **පමණි.** 4) $A, B, C$ **සියල්ලම**

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

19) **පහත ගණක රාමු දෙකේ ඇති සංඛ්‍යා එකතු කළ විට නිවැරදි පිළිතුර වන්නේ,**




1) 229 2) 804 3) 633 4) 831

---

20) **පහත ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

1) **සංඛ්‍යා සම්මත ආකාරයට ලිවීමේදී කලාප අතර ඇති කුඩා ඉඩ වෙනුවට කොමාවක් යොදාගන්නා අවස්ථාත් ඇත.**

2) **කෝටියක් යනු ලක්ෂ 10 කි.**

3) **4721 යන සංඛ්‍යාවේ 2 ඉලක්කම පිහිටි ස්ථානයේ ස්ථානීය අගය මෙන් දහගුණයක්, 7 ඉලක්කම පිහිටි ස්ථානයේ ස්ථානීය අගය වේ.**

4) **4721 හි 4 න් නිරූපණය වන්නේ 1000 කි.**

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS